www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බංග්ලාදේශයේ ඇති වූ විනාශකාරී සුලි සුළඟින් දහස් ගනනින් මරු දකිති

## Thousands die in devastating cyclone in Bangladesh

**සරත් කුමාර විසිනි**
**2007 නොවැම්බර් 20**

නොවැම්බර් 15 දින දකුනු සහ මධ්‍යම බංග්ලාදේශය විනාශයකට ගොදුරු කරමින් හමාගිය දැවැන්ත සුලි සුලඟ දහස් සංඛ්‍යාත ජනතාවකට මරු කැඳවමින් තවත් මිලියන ගනනක් අනාථයන් බවට පත් කලේ ය. ඊයේ සවස වන විට, නිල මරන සංඛ්‍යාව 3,300ක් දක්වා වැඩි වී තිබින. මෙතෙකුදු සුන්බුන් ඉවත් කරමින් පවත්නා දකුනු දූපත් ඇතුලු පිටිසර ප්‍රදේශවලට සහන සේවකයෝ ලඟාවන විට මෙම සංඛ්‍යාව 10,000 ක් දක්වා වැඩි විය හැකි බව බංග්ලාදේශ රතු අඩ සඳ සංවිධානය අනතුරු අඟවා ඇත.

පැයට කිලෝ මීටර් 240 වේගයකින් දිස්ත්‍රික්ක 16 ක් හරහා හමා ගිය සිද්ර් සුලි සුලඟ මීටර් 3 සිට 5 දක්වා උස රල පහරක් ඇති කලේ ය. බහුතරයක් ගොදුරු වූවෝ පහත් බිම් ප්‍රදේශවල පිදුරු සහ මැටියෙන් තනන ලද පහසුවෙන් කැඩෙන සුලු නිවාසවල වෙසෙන දුගී ධීවරයින් සහ ගොවීන් වූහ. නිවාස සමතලා කරමින් ද, ගස්, විදුලි පහන් කනු හා දුරකථන කනු උගුල්ලා දමමින් ද, පාරවල් හා පාලම් විනාශ කරමින් ද හමා ගිය සුලි සුලඟ බෝග වගාවන් පාලු කොට ගොවි පොල සතුන් විනාශයට පත් කලේ ය. ඉරිදා (18), නාවික හමුදාව විසින් මුහුදේ අතරමංවෙ සිටි ධීවරයින් 110 ක් මුදා ගත් නමුත් ට්‍රෝලර් යාත්‍රා 150 ක් හා එහි පිරිස ගැන කිසිදු තොරතුරක් නැත.

සීමිත හදිසි සැලසුම් ක්‍රියාත්මක නො කලේ නම් මරන සංඛ්‍යාව වඩා වැඩි විය හැකි ව තිබින. 1991 ඇති වූ ගෝර්කි සුලි සුලඟ අවම වශයෙන් ජීවිත 138,000 ක් බිලිගත් අතර 1970 භෝලා සුලි සුලඟ මිලියන භාගයක ජනතාව බිලි ගත්තේය. පෙර අනතුරු ඇඟවීමේ පද්ධතිය ක්‍රියාත්මක වීම නිසා මිලියන 3.2 ක් ලෙස ඇස්තමේන්තු ගත ජනකායක් උස් බිම් ප්‍රදේශ දක්වා ගෙනයා හැකි විය. නිලධාරීහු රල පහර බැස ගිය පසු ක්ෂනිකව ආහාර, කූඩාරම් සහ පොරෝනයන් යැවීම ආරම්භ කලහ. ඉතා ම දරුනු ලෙස බලපෑමට හසු වූ ප්‍රදේශවලට 700කට අධික සෞඛ්‍ය සේවා කන්ඩායම් යැවින.

කෙසේ වෙතත්, ස්වේච්ඡා සේවකයින් මත වැඩිමනක් යැපෙන මෙම සහන සැපයීමේ ප්‍රයත්නයන් ව්‍යසනයේ ප්‍රමානයට අනුව ඉතා ම අල්ප වෙයි. බංග්ලාදේශයේ රෙඩ් ක්‍රෙසන්ට් සංවිධානයට අනුව, තක්සේරු ගත පවුල් 900,000 හෝ මිලියන 7ක ජනතාවට නිවාස අහිමි වී ඇත. මිලියන භාගයක නිවෙස් දැඩි ලෙස හානි වී ඇති අතර මින් 200,000 මුලුමනින් ම විනාශ වී ඇත. 3,400 ට වැඩි පාසල් සහ පුහුනු මධ්‍යස්ථාන ද කිලෝමීටර් 485 පාරවල් ද කැඩී බිඳී ගොස් ඇත.

මාධ්‍ය වාර්තාවලට අනුව, සහන සේවකයෝ ගංගා, කුඹුරු, මෙන්ම ගොඩ ගැසී ඇති සුන්බුන් තුල අබන්ඩව තව තවත් මෘත ශරීර සොයා ගනිමින් සිටිති. සමහර පලාත්වල කුනුවෙමින් පවතින මිනිස් සහ සත්ව මලකුනුවල දුර්ගන්ධය ඉවසාගත නොහැකිය. බොහෝ අවස්ථාවල පන බේරා ගත්තවුන්ට තම මල ඥාතීන්ගේ මෘත ශරීර මිහිදන් කිරීමේ පහසුකම් නැත. සමහර අවස්ථාවල දී මෘත ශරීර සමූහ මිනී වලවල්වල වලලා දමන ලදී.

සුලි සුලඟින් දින 4 ට පසුව ද, බොහෝ ප්‍රදේශ කරා සහන සේවකයින්ට ලඟාවීමට නොහැකි වී තිබින. බර්ගුනා දිස්ත්‍රික්කයේ නිලධරයකු වන හරිස් ප්‍රසාද් පාල් බ්‍රිතාන්‍ය පාදක කොට ගත් ටෙලිග්‍රාෆ් මාධ්‍යයට පැවසුවේ ආන්ඩුවේ පරිපාලන නිලධාරියකු ලෙස තමන් වසර 20 ක් තුල මෙවැනි ඛේදවාචකයක් දැක නොමැති බව ය. "ගමක් පාසා ගමක් දෙදරුම් කෑවේය. මිලියන සංඛ්‍යාත ජනතාව වහලක් නැතිව ජීවත් වන අතර ජනයාගෙන් සියයට එකකටත් අඩුවෙනුයි සහන ලැබෙමින් පවතින්නේ" යයි ඔහු පැවසුවේ ය.

පන රැකගත්තවුන් බොහෝමයකට පිරිසිදු ජලය ඇතුලු ආහාර, බෙහෙත් සහ අනෙකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය නොලැබුනි. දහස් සංඛ්‍යාත ජනයා බෙංගාල බොක්කේ පිහිටි දූපත්වල අනාථ වී ඇත. හෙලිකොප්ටර් මගින් විනාශ වූ ප්‍රදේශවලට හෙලන ලද ආහාර, පානීය ජලය, හා බෙහෙත් කිසිසේත් ප්‍රමානවත් නොවෙයි.

වියපත් සතාර් ගාසි මාධ්‍යවලට පැවසුවේ: ,සුලි සුලඟට මගේ පවුලේ 6 ක් ගොදුරු වූනා. මා බියට පත් වී ඇත්තේ අපගේ ඉතිරි අය කුසගින්නෙන් මිය

යයි කියලා. පසුගිය දින ගනනාව පුරා අපි ආහාර නැතිව සිටියෙ.,

ආධාර හිගකම ගැන පැමිනිලි කල ප්‍රාදේශීය නිලධරයකු වන රෆිකුල් ඉස්ලාම් මෙසේ පැවසුවේය: "අපට අවශ්‍ය තරම් ආහාර නැත. අපගේ නිවෙස් සහ කඩ ගසාගෙන ගොස් ඇත. අපට උදව් කිරීමට කිසිවෙකු නැත." වඩාත් ම විපතට පත් වූවෝ දුගීන් බව ඔහු පැහැදිලි කලේ ය. "ඔවුන්ට කෑම පිසීමටවත්, නිදා ගැනීමටවත් තැනක් නැති අතර කෑමටත් කිසිවක් නැත."

බිෂ්කාලී ගංගා අභිමුඛය අසල ඇති මජ්හේර් කුඩා දූපතේ ඉතාමත් ස්වල්ප දෙනෙකු පමනක් පන ගලවා ගත්හ. ගම්වාසීන් 500 න් 100 එක්කෝ මලහ. නැතිනම් අතුරුදහන් වී ඇත. හදිසි ආරක්ෂක කුටි මෙම දූපතේ ඇත්තේ නැත. ගම්වැසියෝ පැවසුවේ සිදු වීමට ඇති ඛේදවාචකය ගැන තමනට කිසිදු අනතුරු අගවීමක් නොලැබුනු බව ය. සියලු ම නිවාස පොළොවට සමතලා වී ඇත. ආහාර නැත. එක ම ලිඳ ලුනු ජලයෙන් අපවිත්‍ර වී ඇත.

"ගස්වලට නැගගත් අපෙන් සමහරක් පන බේරා ගැනීම සඳහා තමා විසින් ම ගස්වලට බැඳ ගත්තා" යි බකුල් බෙගම් පැවසූ අතර සුලි සුලං ආරක්ෂක කුටි සඳහා තමන් මීට පෙරාතුව ඉල්ලා තිබුන ද කිසිවෙක් ඔවුනගේ ඉල්ලීමට කන් නොදුන් බවට ඇය චෝදනා කලාය.

ආහාර සඳහා මංමුලාවෙන් සිටි ජනයා විසුරුවා හැරීමට සමහර ප්‍රදේශවල හමුදාව විසින් ඔවුන්ට බැටන් පොලු ප්‍රහාර එල්ල කර තිබුනු බව බීබීසී ය වාර්තා කලේ ය. විදුලි සංදේශ උපදේශකයකු වන සයීඩ් රහමන් බීබීසී යට පැවසුවේ: "මෙම ජනයාට අවශ්‍ය පමනට ආහාර නොලැබීමට හේතුව වන්නේ ආන්ඩුව සහ ආධාර දෙන සංවිධාන අතර සම්බන්ධීකරනයක් නොමැති කම නිසා" බව ය. ජනතාව වැඩියෙන් ආධාර නොලබන්නේ නම් ඔවුන් කොලරා සහ අනෙකුත් ජලය ආශ්‍රිත රෝග වලට ගොදුරු වීමේ අවධානම ඇති බවට ඔහු අනතුරු අඟවූයේ ය.

ආන්ඩුවේ ඇමතිවරු සහ ඉහල නිලධාරීන් සුලි සුළං අනතුරු ඇඟවීමේ පද්ධතිය ගැන එකිනෙකාගේ පිට කසා ගත්හ. හමුදා පිටුබලය සහිත ආන්ඩුවේ ප්‍රධාන උපදේශක ෆාක්රුදින් අහමඩ් ඉරිදා ප්‍රකාශ කලේ ආන්ඩුවේ ආපදා පරිපාලන කමිටුව ඉතාමත් අසීරු තත්වයන්හි ප්‍රසංශනීය ව කටයුතු කල බව ය.

සුලි සුලං පිලිබඳව සෝදිසි ක්‍රමය නොතිබුනේ නම්, මරන සංඛ්‍යාව ඉතා ඉහල විය හැකි වූ අතර, මෙම අනතුරු අඟවීමේ පද්ධතිය සීමිත විය. සීඑන්එන් වාර්තාවනට අනුව, කාලගුන විද්‍යාඥයින් විසින් අනාවැකි පල කලාට වඩා කලින් කුනාටුව වෙරලට පහර දෙන ලදී. තම නිවෙස්වලින් ඉවත් වන ලෙස බල කරමින් බොහෝ ජනතාව වෙත ස්වෙච්ඡා සේවකයෝ ගිය නමුත් අනෙක් අය ගුවන් විදුලි අනතුරු ඇඟවීම් ගැන විස්වාසය තබා තිබුනි. මිලියන සංඛ්‍යාත ජනතාවක් වෙසෙන වෙරලාසන්න දිස්ත්‍රික්කවල ඇත්තේ සුලි සුලං ආරක්ෂක කුටි 2000 ක් පමනකි.

අනතුරු ඇඟවීම් පද්ධතියේ කාර්‍යයක්ෂමතාවය ගැන ගැටලු මතු කරමින් සෙනසුරාදා නිව් ඒජ් මාධ්‍යයේ කතුවැකියෙන් එය විවේචනය කලේ මෙසේය: "ආපදා අනතුරු ඇඟවීම් පද්ධතියේ සාමාන්‍යයෙන් අර්ථය වන්නේ අනතුරු ඇඟවීම් ලද ජනතාවට ඉබාගාතේ යමින් ආරක්ෂක කුටි සොයා ගැනීමට තමන් ම උපක්‍රම යොදා ගැනීම ය."

කෙටි කාලීන සහ දීර්ඝ කාලීන යලි ඉදිකිරීම් සඳහා ලැබී ඇති ආධාර ප්‍රමානවත් නො වේ. දැවැන්ත විනාශයට එක් හේතුවක් වන්නේ නව සුලි සුලඟක් සඳහා ඔරොත්තු දීම සඳහා පසුගිය ආපදාවෙන් පසු නිවාස සහ ව්‍යාපාරික මධ්‍යස්ථාන ගොඩ නගා නොතිබීම යි. ඉරිදා වන විට, නිවාස ඉදි කිරීම සඳහා ආන්ඩුව විසින් යන්තම් ඇ.ඩො. මිලියන 5.2 ක් වෙන් කර තිබින. ජීවත්වීමේ මාර්ගයක් සහ කිසි දු ආධාරයක් නොමැතිව අතරමං කරනු ලැබූ බහු තරයක් දුගීන්, එලඹෙන සති හා මාසවල තමන් කෙසේ ආහාර පානාදිය සොයා ගන්නේ දැයි නොදනී.

"මාස 6 ට පෙරාතුව, ගංවතුර බංග්ලාදේශය වැනසුවා. එම වසරේ ම සිදු වූ ආපදාවන් දෙකෙහි ම විනාශකාරී සාධක දෙකෙන් එකක් වන්නේ ගංවතුර උතුරු සහ මධ්‍යම දිස්ත්‍රික්කවල එලදාව අඩු කිරීම යි. මෙම සුලි සුලඟ දැන් දැන් වෙරලාසන්න ප්‍රදේශ වල එලදා විභවය සියයට 75 දක්වා විනාශ කර තිබේ. ආහාර සුලබතාවත්, ආරක්ෂාවත් සමස්ථයක් ලෙස ම මුලු රටේම, ක්ෂනික අවශ්‍යතාවය වන අතර මෙමගින් දීර්ඝ කාලීන බලපෑමක් ඇති නොවේයැයි අපි අපේක්ෂා කරමු" යැයි ඔක්ස්ෆම් නේවාසික කලමනාකාර හීදර් බ්ලැක්වෙල් බ්ලූම්බර්ග් කොම් වෙත පැවසුවේ ය.

කෘෂිකාර්මික ඉඩම් අක්කර 23,000 වැඩිමනක් සුලං සහ ගං වතුර මගින් විනාශ වූ අතර, තක්සේරු ගත සහල් ටොන් 600,000 අස්වැන්නක් ද විනාශ විය. සිය ගනනක් ඉස්සන් ගොවිපල විනාශ වූ අතර, ගොවිපොල සත්වයින් 242,000 ද මලහ. කෘෂිකාර්මික කම්කරුවන්ගෙන් සියයට 70 ක් ඉඩම් රහිතයින් වන අතර, ඔව්හු ධීවර කර්මාන්තයේත්, සාමූහික වගාවේත් නිරත වන අතර සමහරු ඉස්සන් ගොවිපොල වල හෝ ලුනු නිෂ්පාදන ගොවිපොලවල දෛනික කම්කරුවන් ලෙස දිවි ගෙවති.

මහා බලවතුන්ගේ ආන්ඩු නැවතත් බංග්ලාදේශය වැනි දුගී රටවල් වෙන තම පිලිකුල ප්‍රදර්ශනය කර ඇත. මෙතෙක්, ජාත්‍යන්තර ආධාර සමස්ථයක් ලෙස ලැබී ඇත්තේ ඇ.ඩො. මිලියන 25 වැනි සොච්චමකි. ඇමරිකානු පරිපාලනය සිද්ර් සුලි සුලං අනාථවූවන්ට

තම නාමික කනගාටුව පල කල අතර ප්ලාස්ටික් තහඩු සහ සනීපාරක්ෂක කට්ටල වැනි ආහාර නොවන ද්‍රව්‍යයන් ටොන් 35 ක් සමග යම්තම් මූලික ආධාර සැපයීය. එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇ.ඩො. මිලියන 7 ක්ද, ජර්මනිය ඇ.ඩො. 731,000 ක්ද, යුරෝපීය සංගමය ඇ.ඩො. මිලියන 2.2 ක්ද, බ්‍රිතාන්‍යය ඇ.ඩො. මිලියන 5 ක්ද, ප්‍රන්සය ඇ.ඩො. 730,000 ක් සහ ඔස්ට්‍රියාව ඇ.ඩො. මිලයන 3 ක් ද සැපයී ය.

පෙර දැකිය නොහැකි ස්වභාවික බලවේගවල ප්‍රතිඵලයක් ලෙස සුලු සුලං ඇති වන නමුත් ඉන් මතු වන විනාශයන් මග හැරිය හැක්කේ එහි බලපෑම අවම කර ගැනීම සඳහා තාක්ෂනයේ දැවැන්ත වර්ධනය භාවිතා කිරීම මගිනි. බංගලිදේශයේ අවදානම් සහිත ප්‍රදේශවල නවීන අනතුරු ඇගවීමේ පද්ධතියක්, ගුනාත්මක හදිසි ආරක්ෂක වාසස්ථාන, කුනාටු බාධක සහ සුලි සුලං ආරක්ෂක කුටි තිබුනේනම් පසුගිය බ්‍රහස්පතින්දා සිදු වූ මරන වලින් බහුතරයක් නිසැකව ම ගලවා ගත හැකිව තිබින. ඒ කෙසේ වෙතත් කාන්දු වීගෙන එන ජාත්‍යන්තර ආධාර ප්‍රදර්ශනය කර ඇති පරිදි, පන රැක ගත් බහුතරයකට ධනවාදය යටතේ අපේක්ෂා කල හැක්කේ තමන්ගේ විනාශ වූ ජීවිතවලට යන්තම් ගැට ගසා ගත හැකි සොච්චමකි.

© www.wsws.org